**පුංචි ඡන්දය ඉල්ලා පැෆරල් උසාවි යයි** 02-පිටුවට

# පුංචි ඡන්දය ඉල්ලා පැෆරල් උසාවි යයි

සරත් ධර්මසේන

**සියලුම පළාත් පාලන ආයතනවල හෝ දැනට පළාත් සීමා නිර්ණය කිරීමේ කටයුතු අවසන් වී ඇති ආයතනවල ඡන්ද විමසීම් වහාම පැවැත්විය යුතු බවට අදාළ බලධාරීන්ට නියෝගයක් නිකුත් කරන්නැයි ඉල්ලා "පැෆරල් සංවිධානය සහ එහි විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා ඊයේ (27 දා) ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ගොනු කළේය.**

එසේ නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන කාලසීමාවක් ඇතුළත පළාත් පාලන ඡන්ද විමසීම් පවත්වන්නැයි නියෝග කරන ලෙස පෙත්සමෙන් ඉල්ලා ඇත.

දිවයිනේ ප්‍රාදේශීය සභා නගර සභා ඇතුළු පළාත් පාලන ආයතන 335 ක සේවා කාල සීමාවන් අවසන් වී එම ආයතනවලින් වැඩි සංඛ්‍යාවක ඡන්ද 2015 වර්ෂයේදී ද සෙසු ආයතනවල ඡන්ද මේ වර්ෂයේ පැවැත්විය යුතු නමුත් පළාත් පාලන අමාත්‍යවරයා ඒ සඳහා පියවර නොගත් බවත් ඡන්ද විමසීම් විටින් විට කල් දැමූ බවත් පෙත්සමේ සඳහන් කර ඇත.

පළාත් පාලන ඇමැති ෆයිසර් මුස්තාෆා, එම අමාත්‍යාංශයේ ලේකම්, මැතිවරණ කොමිසමේ සභාපති මහින්ද දේශප්‍රිය, එම කොමිසමේ සාමාජිකයන්, පළාත් සීමා නිර්ණය කිරීමේ කමිටුවේ සභාපති අශෝක පීරිස්, එහි සාමාජිකයන් සහ නීතිපති පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස නම් කර තිබේ.

පළාත් පාලන මැතිවරණ පැවැත්වීමට අපොහොසත් වීම රටවැසි ජනතාවගේ ඡන්ද අයිතිය මෙන්ම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බවට තීන්දු කරන ලෙසද පෙත්සමෙන් ඉල්ලා ඇත.

නීතිඥ මංජුල බාලසූරිය මගින් පෙත්සම ගොනුකර තිබිණි.